# ගිණුම්කරණ සමීකරණ

ලූකා පැසියෝලිගේ දෙවන පරපුර ...

**ගයාන් දිලීප**

**Weekly paper 01**

1. පහත සදහන් ද අතරින් ගිණුම්කරණ නිමවුමක් නොවන්නේ කුමක් ද ?.
   I. මූල්‍ය තත්ව ප්‍රකාශය
   II. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
   III. මුදල් ප්‍රවාහ ප්‍රකාශය
   IV. ගිණුම්කරණ සටහන්
   V. ගනුදෙනු හා සිද්ධි

2. පහත සදහන් ද අතුරින් ජංගම වත්කම් පමණක් ඇතුලත් පිළිතු දක්වන්න.
   I. ඉඩම්, භාවිතා කරන යන්ත්‍ර, විකුණීමේ අරමුනින් පවත්නා තොග.
   II. විකිණීමේ අරමුනින් පවත්නා තොග, බැංකු ශේෂය, ලැබිය යුතු වෙළෙඳ ණය
   III. ගොඩනැගිලි, භාවිතා කිරීම සදහා පවත්නා තරාදි, මෝටර් රථය
   IV. මෝටර් රථ අලෙවි කරන ව්‍යාපාරයක භාවිතා කරන රථ, ඉඩම්
   V. ලිපිද්‍රව්‍ය අයිතම, ණයහිමි ශේෂය, බැංකු අයිරාව

ගිණුම් වැඩබිම

3. මූලික ගිණුම්කරණ සමීකරණය නිවැරදිව දක්වෙන පිළිතුර දක්වන්න.
   I. වත්කම් = වගකීම් + හිමිකම්
   II. ජංගම වත්කම් + ජංගම වගකීම් = හිමිකම්
   III. වත්කම් + වගකීම් = හිමිකම්
   IV. මුළු වත්කම් = ජංගම වත්කම් + ජංගම වගකීම්
   V. ඉහත කිසිවක් නොවේ

4. එක්තරා ගනු දෙනුවක් පහත පරිදි මූලික ගිණුම්කරණ සමීකරණයට ගැලපුම් කර තිබුණි.

   **වත්කම්** වැඩි වේ

   **හිමිකම්** වැඩි වේ

   මෙම ගනු දෙනුව නිවැරදිව විස්තර කරන ගිණුම්කරණ ප්‍රකාශය කුමක් ද ?.

   I. ණයගැතියන්ගෙන් මුදල් ලැබීම
   II. අයිතිකරු ගැණිලි කිරීම
   III. අයිතිකරු විසින් ව්‍යාපාරයට යොදවන ලැබූ රථවාහනය

IV. ණයහිමියන්ට මුදල් ගෙවීම.

V. ඉහත කිසිවක් නොවේ.

5. කිසියම් වත්කමක් ජංගම වත්කමක් ලෙස සැලකීමට අත්‍යවශ්‍ය කොන්දේසි මොණවා ද?

- ……………………………………………………………………………………………
- ……………………………………………………………………………………………

6. පිරිවැය රු. 4 500 000 ක් වූ රථවාහනයක් මූලික ගෙවීම ලෙස රු. 1 500 000 ක් ගෙවා ණයට මිලදී ගැනීමට අදාල ගනුදෙනුවේ බලපෑම මූලික ගිණුම්කරණ සමීකරණයන් යටතේ දක්වන්න.

| වත්කම් | = | වගකීම් | + | හිමිකම් |
|---|---|---|---|---|
| …………… | | …………… | | …………… |
| …………… | | …………… | | …………… |

7. ව්‍යාපාරයේ කිසියම් දිනකට අයිතිකරුගේ හිමිකම වැඩිවීමට බලපාන ගනුදෙනුවක් නොවන්නේ කුමක් ද ?

ගිණුම් වැඩබිම

I. අයිතිකරු විසින් රථයක් ව්‍යාපාරයට යෙදවීම.

II. අයිතිකරුගේ බැංකු ගිණුමේ පවතින මුදල ව්‍යාපාරය වෙනුවෙන් යෙදවීම.

III. ව්‍යාපාරය විසින් ගෙවිය යුතු ණයහිමි ශේෂයක් අයිතිකරු විසින් ගෙවීම.

IV. ව්‍යාපාරය විසින් ගෙවිය යුතු වියදමක් අයිතිකරු විසින් ගෙවීම.

V. අයිතිකරුගේ වියදමක් ව්‍යාපාරය විසින් ගෙවීම.

8. පහත ගනු දෙනු නිසාවෙන් මාසය අවසානයේ වගකීම්වලට ඇතිවන ශුද්ධ බලපෑම කොපමණ ද ?.

- රු. 100 000 ක පිරිවැය වූ තොගයක් රු. 40 000 ක් ගෙවා ණයට මිලදී ගැනීම.
- අයිතිකරු විසින් ණයහිමියන්ට ගෙවූ මුදල රු. 25 000 කි.
- මාසික විදුලිය බිල්පත රු. 24 000 ක් වූ අතර මුදලින් රු. 9 000 ක් විදුලි බල මණ්ඩලයට ගෙවා ඇත.

……………………………………………………………………………………………

……………………………………………………………………………………………

**For Group Classes**
**071 26 16 609**